*සැ. යු.* - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2016 වර්ෂය සඳහා ගාල්ල සහ බලපිටිය අධිකරණ කලාපවලට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,971 - 2016 ජූනි මස 10 වැනි සිකුරාදා - 2016.06.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 928 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 930 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 933 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 936 |

*සැ. යු.* - හෝමියෝපති පනත් කෙටුම්පත 2016 අප්‍රේල් මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජූලි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජූනි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - මොණරාගල**

රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

මොණරාගල මහාධිකරණයේ, වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ, මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකණයේ නඩු විභාගය අවසන්ව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

02. ටෙන්ඩර්පත් මොණරාගල මහාධිකරණය විසින් නිකුත් කරනු ලබන අයදුම්පත් පමණක් විය යුතු අතර, 2016.06.10 වැනි දින සිට 2016.07.10 දින දක්වා මොණරාගල මහාධිකරණයේ කාර්යාලයෙන් රු. 100 ක් ගෙවා ටෙන්ඩර්පත් ලබාගත හැකි ය.

03. ටෙන්ඩර්පත් පිටපත් 02කින් යුක්ත විය යුතු අතර, ඉන් එකක් මුල් ලේඛනය ලෙස ද, අනෙක අනුපිටපත ලෙස ද, ලියා 9 x 4 ප්‍රමාණයේ ලිපි කවර දෙකක දමා එම කවර දෙක ඊට ප්‍රමාණයෙන් විශාල කවරයක බහා ඉදිරිපත් කළ යුතු ය. එසේ ම එක් එක් වාහන සඳහා වෙන වෙන ම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු ය.

04. ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් ''රෙජිස්ට්‍රාර්, මහාධිකරණය, මොණරාගල'' යන ලිපිනයට හෝ අතින් භාරදිය යුතු අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''අංක .......................... දරන වාහනය සඳහා මිල ගණන්'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

05. මෙම මිළ ගණන් 2016.07.11 දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු ය. එම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී ආපසු ගෙවනු ලබන පහත සඳහන් පරිදි ඇප තැන්පතුවක් මොණරාගල මහාධිකරණයේ තැන්පත් කර ඊට නිකුත් කළ කුවිතාන්සියේ පිටපතක් ටෙන්ඩර්පතට අමුණා තිබිය යුතු ය.

07. 2016.06.10 දින සිට මෙම වාහන අතරින් 01, 02 දරන වාහන මොණරාගල මහාධිකරණයේ දීත්, 03, 04 දරන වාහන වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දීත්, 05, 06 දරන වාහන මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේත් රෙජිස්ට්‍රාර් මහතාගේ අවසරය ඇතිව සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා පරීක්ෂා කර බැලිය හැකි ය.

08. ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරුවන් වෙත මොණරාගල මහාධිකරණය ලියාපදිංචි තැපැල් මගින් දන්වා යවනු ලබන අතර, එදින සිට සති 02ක් ඇතුළත සම්පූර්ණ මුදල් වාහන රඳවා ඇති අධිකරණයේ එකවර තැන්පත් කර වාහනය ඉවත් කර ගත යුතු ය. එසේ නොවන අවස්ථාවන්හිදී අදාළ ටෙන්ඩර්කරුගේ තැන්පත් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ. එසේ ම අදාල කාලය තුළ මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් තක්සේරු මුදලට වැඩියෙන් ඊළඟ වැඩිම වටිනාකමට ඉල්ලුම් කර ඇති ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය පිරිනමනු ලැබේ.

09. 2016.07.11 වැනි දින ප. ව. 2.00 ට මොණරාගල මහාධිකරණයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අතර, ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකි ය. එසේ නියෝජිතයෙකු සහභාගි කරන අවස්ථාවකදී කොන්දේසි පත්‍රය සමග අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කර එවිය යුතු ය. ටෙන්ඩර්කරුගේ හෝ නියෝජිතගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

10. ටෙන්ඩර් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 055 2276696 ඔස්සේ මොණරාගල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ලබාගත හැකි ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහනයේ ලියාපදිංචි අංකය* | *වර්ගය/මාදිලිය* | *ඇප තැන්පතු* | *වාහනය පරීක්ෂා කළ හැකි ස්ථානය* |
|---|---|---|---|---|---|
| 01. | 15/2015 (අපරාධ) | WPVU 4858 (ලි. ප. කළ හැකිය) | Motor Cycle (Bajaj Discover) | රු. 2,000 | මහාධිකරණය, මොණරාගල |
| 02. | 88/2014 (අපරාධ) | UP YO 7894 (ලි. ප. කළ හැකිය) | Motor Tricycle (Bajaj RE) | රු. 2,000 | මහාධිකරණය, මොණරාගල |

| අනු. අංකය | නඩු අංකය | වාහනයේ ලියාපදිංචි අංකය | වර්ගය/මාදිලිය | ඇප තැන්පතු | වාහනය පරීක්ෂා කළ හැකි ස්ථානය |
|---|---|---|---|---|---|
| 03. | BR 379/14 | PQ 9045 (ලි. ප. කළ හැකිය) | D/P/V TATA | රු. 7,500 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, වැල්ලවාය |
| 04. | 91052 | P. T. 6762 (ලි. ප. කළ හැකිය) | D/P/V (MAHINDRA MAXXIMO) | රු. 7,500 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, වැල්ලවාය |
| 05. | 43715 | 26 ශ්‍රී 4450 (ලි. ප. කළ හැකිය) | Motor Lorry. (Ashok Leyland) | රු. 2,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 06. | 60393 | 41 ශ්‍රී 3590 (ලි. ප. කළ හැකිය) | Motor Lorry (TATA) | රු. 5,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල. |

වසන්ත ජිනදස,
මහාධිකරණ විනිසුරු.

2016 මැයි මස 18 වැනි දින,
මොණරාගල ඌව පළාත්බද මහාධිකරණයේ දී ය.

06-258

---

**මහාධිකරණය - කුරුණෑගල**

අධිකරණවල රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම

පහත සඳහන් අධිකරණයන් හි රාජසන්තක කරන ලද වාහන පහතින් දක්වා ඇති අධිකරණයන් හි දී 2016.06.10 වැනි දිනට පසු අදල අධිකරණයන් හි රෙජිස්ට්‍රාර්වරුන් මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇති අතර මීට අදළ ටෙන්ඩර් ලියකියවිලි කුරුණෑගල මහාධිකරණය මගින් 2016.06.10 වැනි දින සිට 2016.06.27 දින දක්වා නිකුත් කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 100 පෝරම ගාස්තුවක් කුරුණෑගල මහාධිකරණයට ගෙවිය යුතු ය. මීට අමතරව රු. 10,000 ආපසු ගෙවන ඇප තැන්පත් මුදලක් ටෙන්ඩර් පෝරම ලබා ගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ය. අනෙකුත් විස්තර හා කොන්දේසි ටෙන්ඩර් ලියවිලි සමග ඔබට සපයනු ලැබේ. සියලුම මුදල් ගෙවීම් කටයුතු කාර්යාල දිනයන්හි දී පෙ. ව. 8.30 සිට ප. ව. 3.00 දක්වා සිදුකළ හැකි ය. 2016.06.28 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩරය විවෘත කිරීමට නියමිතය.

සුනන්ද කුමාර රත්නායක,
මහාධිකරණ විනිසුරු,
කුරුණෑගල.

2016 මැයි මස 18 වැනි දින,
කුරුණෑගල මහාධිකරණයේ දී ය.

**භාණ්ඩ පිළිබඳ විස්තරය**

| අනු. අංකය | නඩු අංකය | වාහන වර්ගය | ලියාපදිංචි අංකය | පරීක්ෂා කළ හැකි ස්ථානය | පරීක්ෂා කිරීම සඳහා අවසර ලබාගත යුතු නිලධාරියා |
|---|---|---|---|---|---|
| 01. | 10001/10/MISM | ලොරි රථය | 43 -6582 | මහෙස්ත්‍රාත් අධිකරණය කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |
| 02. | 15839/10/MISM | ලොරි රථය | 227-8692 | මහෙස්ත්‍රාත් අධිකරණය කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |

| අනු. අංකය | නඩු අංකය | වාහන වර්ගය | ලියාපදිංචි අංකය | පරීක්ෂා කළ හැකි ස්ථානය | පරීක්ෂා කිරීම සඳහා අවසර ලබාගත යුතු නිලධාරියා |
|---|---|---|---|---|---|
| 03. | 95142/08/MISE | ලොරි රථය | JK-6990 | මහෙස්ත්‍රාත් අධිකරණය කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |
| 04. | 37466/11/E | ත්‍රිරෝද රථය | YM-9198 | මහෙස්ත්‍රාත් අධිකරණය කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |
| 05. | 53095/13MISE | ට්‍රැක්ටර් ට්‍රේලරය | 44 ශ්‍රී 3084 | මහෙස්ත්‍රාත් අධිකරණය කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |
| 06. | 16333/10/MISE | ලොරි රථය | 42-2454 | මහෙස්ත්‍රාත් අධිකරණය කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |
| 07. | 15978 | ඉසුසු එල්ෆ් ලොරි රථය | 47-0545 | මහෙස්ත්‍රාත් අධිකරණය හෙට්ටිපොල | රෙජිස්ට්‍රාර් |

06-254

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - බලංගොඩ

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

බලංගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයා ගත නොහැකි පහත සඳහන් භාණ්ඩ 2016.06.25 වැනි දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ. ව. 8.30 ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියළුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී. වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතු ය.

දුමින්ද පී. මුදුන්කොටුව,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බලංගොඩ.

2016 මැයි මස 18 වැනි දින,
බලංගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසිය සඳහා නියමිතව ඇති භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 42551 | 24 ශ්‍රී 7081 දරන මර්සිඩීස් බෙන්ස් වර්ගයේ ලොරි රථය | 01 |
| 02. | 37723 | 48 ශ්‍රී 2049 දරන ලොරි රථ | 01 |
| 03. | 35101 | 27 ශ්‍රී 5718 දරන ලොරි රථ | 01 |
| 04. | 33345 | 34 ශ්‍රී 9887 දරන ඩෙලිකා වෑන් රථ | 01 |
| 05. | 34843 | SGGQ 0568 දරන ත්‍රීවිල් රථ | 01 |
| 06. | 25094 | SGJO 1262 දරන රතුපාට ත්‍රීවිල් රථ | 01 |
| 07. | 37878 | SGGF 9571 දරන රතුපාට ත්‍රීවිල් රථ | 01 |
| 08. | 34576 | SGGU 7668 දරන කොළපාට ත්‍රීවිල් රථ | 01 |
| 09. | 51248 | SGGP 5112 දරන රතුපාට ත්‍රීවිල් රථ | 01 |
| 10. | 27245 | UPHA 2481 දරන දිරාපත්වී ඇති ත්‍රීවිල් රථ | 01 |
| 11. | 48967 | WPWL 4871 දරන යතුරු පැදි | 01 |
| 12. | 47516 | NWMD 8213 දරන යතුරුපැදි | 01 |
| 13. | 28363 | 95 ශ්‍රී 2766 දරන යතුරු පැදි | 01 |
| 14. | 21491 | 8 ශ්‍රී 4273 දරන Twin CB 125 යතුරුපැදි | 01 |

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 15. | 46094 | ටේලරය සහ අත් ට්‍රැක්ටර් ඇන්ජිම් | 01 |
| 16. | 47695 | ටේලරය සහිත අත්ට්‍රැක්ටර් ඇන්ජිම් (Kubota - 120) | 01 |
| 17. | 39681 | ටේලරය සහිත අත් ට්‍රැක්ටර් ඇන්ජිම | 01 |
| 18. | 39455 | SIFANG වර්ගයේ අත් ට්‍රැක්ටර් ඇන්ජිම් | 01 |
| 19. | 42540 | අත් ට්‍රැක්ටර් ඇන්ජිම් (GPT 80 Gold star) | 01 |
| 20. | AR 799 | පා පැදි | 03 |
| 21. | 05576 | පා පැදි | 01 |
| 22. | නඩු අංක රහිත | පා පැදි | 05 |
| 23. | 18759 | හේස්ප්‍රේ දියර ඉසින යන්ත්‍ර | 01 |
| 24. | 37361 | කහපාට ගෑස් සිලින්ඩර් | 01 |
| 25. | 52493 | කෙල් විනේටර් වර්ගයේ ශීතකරණ | 01 |
| 26. | 56819 | ගෑස් සහිත නිල්පාට සිලින්ඩර් | 01 |
| 27. | 56819 | ගෑස් ලිප් | 01 |
| 28. | 54266 | ගෑස් ලිප් | 01 |
| 29. | 49510 | ගෑස් ලිප් | 01 |
| 30. | 51434 | ජංගම දුරකථන | 01 |
| 31. | 37161 | ජංගම දුරකථන | 01 |
| 32. | 37730 | ජංගම දුරකථන | 01 |
| 33. | AR 09/12 | ජංගම දුරකථන | 01 |

06-207

---

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### භාවිතයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ වෙන්දේසි කිරීම

මෙම කොමිෂන් සභාවේ භාවිතයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ 2016.06.22 වැනි දින පෙ. ව. 10.00 ට වෙන්දේසි කර විකුණනු ලැබේ. (භාණ්ඩ ලැයිස්තුව පහත දක්වා ඇත)

2015.12.31 දිනට පවත්වනු ලැබූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලේඛනය (පොදු 47)

| *අයිතම අංකය* | *භාණ්ඩ වර්ගය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 1. | ඡායා පිටපත් යන්ත්‍රය | 1 |
| 2. | යතුරු ලියන පුටු ඇඳි සහිත වේවැල් පුටු සාමාන්‍ය පුටු | 24 |
| 3. | වානේ කැබිනට් (ලා 4) | 3 |
| 4. | ගණක යන්ත්‍ර | 6 |
| 5. | විදුලි පංකා පාදස්තල | 6 |
| 6. | භාග කබඩ් | 2 |
| 7. | CPU | 19 |
| 8. | UPS | 20 |
| 9. | මවුස් | 22 |
| 10. | Key Board | 19 |
| 11. | පරිගණක මොනිටර් | 11 |
| 12. | පරිගණක ප්‍රින්ටර් (Laser Jet) | 1 |
| 13. | 175 x 65 R 14 (බ්‍රිජස්ටන්) | 4 |
| 14. | 195 x 65 R 15 (රේඩියේටර්) | 8 |
| 15. | 205 x 55 R 16 (බ්‍රිජස්ටන්) | 4 |
| 16. | 265 x 65 R 17 (බ්‍රිජස්ටන්) | 4 |
| 17. | මාණ්ඩලික නිලධාරි මේස | 1 |
| 18. | බල්බ් වැල් | 49 |
| 19. | පරිගණක පවර් සප්ලයි | 2 |
| 20. | මල බැඳුනු යතුරු තොගයක් | |
| 21. | භාවිතයෙන් ඉවත්කළ විදුලි තැඳුම් උපාංග | |
| 22. | ෆෑන් රෙගියුලේටර් | 3 |
| 23. | පංචර් | 3 |
| 24. | බහුකාර්ය විදුලි දිගු | 6 |
| 25. | පිරිමි බෑග් (බ්‍රීෆ් කේස්) | 1 |
| 26. | ටියුබ් ලයිට් කවර | 4 |
| 27. | පැරණි ටැප් කෑලි | 8 |
| 28. | විදුලි හීටර් | 4 |
| 29. | පරිගණක වයර් තොගයක් | |
| 30. | ෆිල්ටර් 2 ක කොටස් | |
| 31. | විදුලි සෝපානයෙන් ඉවත් කළ බැටරි | 4 |
| 32. | CLI යුනිට් | 3 |
| 33. | විධායක කුෂන් පුටු | 2 |
| 34. | පරිගණක ප්‍රින්ටර් | 3 |
| 35. | බිත්ති විදුලි පංකා | 1 |
| 36. | සිවිලින් විදුලි පංකා | 4 |
| 37. | විදුලි සීනු | 7 |
| 38. | වානේ කබඩ් | 1 |
| 39. | අබලි මේස | 2 |
| 40. | පරිගණක පුටු | 1 |
| 41. | මලකඩ කෑ තේ බන්දේසි | 2 |
| 42. | වතුර ජෝගු | 1 |
| 43. | රිජිෆෝම් ෂීට් කිහිපයක් | |

| අයිතම අංකය | භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 44. | අබලි ඇඳි පුටු (වේවැල්) | 2 |
| 45. | දිරාපත් නාන කාමර දෙරක් | |
| 46. | පැරණි වාහන අමතර කොටස් තොගයක් | |
| 47. | මේස වලින් ගලවා ඉවත් කළ අගුළු තොගයක් | |
| 48. | 4" එස්ලෝන් බට කිහිපයක් | |
| 49. | කැඩුනු යකඩ පුටු | 1 |
| 50. | ඇලුමිනියම් තහඩු (රැලි තහඩු) කිහිපයක් | |
| 51. | උළු තොගයක් | |
| 52. | ගලවා ඉවත් කළ පාටිෂන් බෝඩ් | 5 |
| 53. | ෆිල්ටර් කොටස් | 3 |
| 54. | වාහන ෂීට් | 1 |
| 55. | ලිපිකරු මේස | 3 |
| 56. | ගැලවූ ජනෙල් පලු | 1 |
| 57. | අබලි මේස | 2 |
| 58. | දෙර දෙක භාග ලී කබඩ් | 1 |
| 59. | අත් සහිත ලී පුටු (වේවැල්) | 5 |
| 60. | යකඩ පුටු | 1 |
| 61. | ප්ලාස්ටික් පුටු | 1 |
| 62. | සෙවිලි උළු | 70 |
| 63. | ෆ්ලයිවුඩ් ෂීට් කීපයක් | |
| 64. | 10' දිග ලී කීපයක් | |
| 65. | ෆාගෝ වැන් එකකින් ඉවත් කළ ෂීට් | 2 |
| 66. | වානේ අල්මාරි | 7 |
| 67. | වානේ කැබිනට් (ලා 4) | 3 |
| 68. | මාණ්ඩලික කැරකෙන පුටු | 1 |
| 69. | සැටි කැලි | 2 |
| 70. | කැබිනට් වානේ (ලා 4) BC/1/R/A-1/13/02 | 1 |
| 71. | වානේ කැබිනට් (ලා 2) | 2 |
| 72. | මාණ්ඩලික පුටු (කැරකෙන) | 1 |
| 73. | ඇඳි සහිත වේවැල් පුටු | 4 |
| 74. | වානේ කැබිනට් (ලා 2) | 2 |
| 75. | ස්ටේප්ලර් | 2 |
| 76. | මාණ්ඩලික පුටු (කැරකෙන) | 1 |
| 77. | වානේ කබඩ් (ලා 2) | 2 |
| 78. | වානේ කබඩ් (ලා 2) | 3 |
| 79. | වානේ කබඩ් (ලා 4) | 1 |
| 80. | යකඩ අල්මාරි (ලොකු) | 1 |
| 81. | ඇදි සහිත ලී පුටු | 5 |
| 82. | වානේ කබඩ් (ලා 4) | 3 |
| 83. | වානේ කබඩ් ( ලා 2) | 5 |
| 84. | අල්මාරි (වානේ) BC/Open/03/01 | 1 |
| 85. | අල්මාරි (ලී) | 1 |
| 86. | ඇඳි සහිත ලී පුටු | 10 |
| 87. | වානේ කබඩ් (ලා 4) | 12 |
| 88. | වානේ කබඩ් (ලා 2) | 6 |
| 89. | විධායක මේස | 1 |
| 90. | දිග හාන්සි පුටුව (යකඩ) උළු වස්ස, සමග දෙර, අබලි ලිපිකරු මේසය | |
| 91. | වානේ පරිගණක පුටු | 5 |
| 92. | ප්‍රථමාධාර පෙට්ටි | 1 |
| 93. | ගණක යන්ත්‍ර | 6 |
| 94. | ස්ටේප්ලර් | 4 |
| 95. | කැබිනට් (කැලි 16) | 1 |
| 96. | කැබිනට් (කැලි 06) | 1 |
| 97. | කැලි 3 හාන්සි පුටු | 1 |
| 98. | හීටර් | 1 |
| 99. | පරිගණක (CPU/UPS /මොනිටර්) | 1 |
| 100. | පාටිෂන්වලින් ඉවත් කළ වීදුරු | 4 |
| 101. | පාටිෂන් වලින් ඉවත් කළ තුනී MDF බෝඩ් | 4 |
| 102. | ඇළුමිනයම් දෙර | 1 |
| 103. | පාටිෂන් වලින් ඉවත් කළ ඇළුමිනියම් පටි | 14 |
| 104. | මාණ්ඩලික නිලධාරි මේස | 1 |
| 105. | වානේ කබඩ් ලා - 4 | 5 |
| 106. | යකඩ ඇඳි පුටු | 1 |

02. ඉහත සඳහන් භාණ්ඩ වෙන්දේසි කිරීම මෙම පරිශ්‍රයේදී පෙ. ව. 10.00 ට ආරම්භ කරනු ලැබේ. ගැණුම්කරුවන් විසින් මුදලින් වටිනාකම ගෙවා තමන් මිලදී ගත් සියලුම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර මෙම කාර්යාල පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු ය.

ජනාධිපති නීතිඥ ඩිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ (මිය),
අධ්‍යක්ෂ ජනරාල්.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව,
36, මලලසේකර මාවත,
කොළඹ 07.
2016 මැයි

06-301

# රජයේ නොවන දැන්වීම්

**2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි**

වර්ෂ 2016.03.18 වැනි දින බ්‍රයිට් බ්‍රාවෝ හොටෙල් (පීවීටී) එල්ටීඩී නමින් සමාගමක් කුරුණෑගල, කොළඹ පාර, අංක 250 හි සංස්ථාගත කර ඇති බවත් එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 112556 බවත් ශ්‍රී ලංකා වාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ත්‍රී එම් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-208

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ආර්. එම්. ඒ. ලෙදර් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 74233
සංස්ථාගත කළ දිනය : 2010 සැප්තැම්බර් මස 08
ලිපිනය : අංක 41, කුමාර වීදිය, කොළඹ 11.

සුබ්‍රමනියම් තුරෙයිරාජා,
සමාගමේ ලේකම්.

06-221

---

**විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කොළවෙනිගම, පල්ලෙගම, ගංගොඩ, සම්පත් හි පදිංචි විජමුනි දූරගේ නිලූකා වසන්ති (අංක 855013932 V දරන ජාතික හැඳුනුම්පත හිමි) වන මම, මාතර ප්‍රසිද්ධ නොතාරිස් ජී. ජී. එම්. ලලිත් ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කළ අංක 10516 සහ 2014.07.24 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් එකී කොළවෙනිගම, බෙලිඅත්තකුඹුර, දෙබලහේන හි පදිංචි කොට්ට කංකානම්ගේ මයුර තිවංක (අංක 923572449 V දරන ජාතික හැඳුනුම්පත හිමි) නමැති අයට ලබාදුන් ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව, සියලු මහජනතාවත් අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා.

ඇටර්නි බලපත්‍රයේ සඳහන් බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාරගනු නොලබන බව සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා.

විජමුනි දූරගේ නිලූකා වසන්ති.

06-224

---

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මහනුවර හීරස්සගල පාර, අංක 249 දරන ස්ථානයේ පදිංචි ආනන්ද පරාක්‍රම පලිපාන වන මම කුරුණෑගල සහකාර රෙජිස්ට්‍රාර් ජෙනරාල් (වයඹ උතුරු මැද කලාපය) කාර්යාලයේ ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර පොතේ 28 වන කාණ්ඩයේ 1308 පත් ඉරුවේ 1228 දිනපොත් අංකය යටතේ 2009.07.07 වැනි දින ලියාපදිංචි කර ඇටර්නි බලපත්‍රය 2016.05.24 වැනි දින සිට අවලංගු කර ඇති බව මෙයින් දැනගනිත්වා. ඒ අනුව කුරුණෑගල මිල්ලව හිටිනාවත්ත දරන තැන පදිංචි රත්තිලක දූරයලාගේ නිමල් කරුණාතිලක යන අය තව දුරටත් මාගේ ඇටර්නි බලකරු නොවන බව ප්‍රකාශ කර සිටිමි.

ආනන්ද පරාක්‍රම පලිපාන.

2016 මැයි මස 24 වැනි දින.

06-228

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ස්මාර්ට් ප්‍රොජෙක්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 113384
ලියාපදිංචි ලිපිනය : අංක 275, 2 වන මහල, නාවල පාර, නාවල.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958

06-273/1

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : බෙයිරා සින්තටික් යාර්න් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 113472
ලියාපදිංචි ලිපිනය : ලෙවල් 03, පාර්ක්වේ ගොඩනැගිල්ල, අංක 48, පාර්ක් වීදිය, කොළඹ 02.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958

06-273/2

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ග්ලෙන්මෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 113607
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02,
කොළඹ 03.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958

06-273/3

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

හොං කොං කොවුලුන්, කිවුන් ටොං, 100 හොවු මිංග් වීදිය, ලෑන්ඩ් මාර්ක් ඊස්ට්, 02, 23 වන මහල හි පිහිටි ස්මාර්ට් ෂර්ට්ස් ලිමිටඩ් වන සමාගම විසින් කොළඹ 08, මැගසින් පාර, අංක 8-1/5 හි පදිංචි හින් ජු ලී අපගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කරන ලද ඇටර්නි බලපත්‍රය මෙදින සිට අවලංගු වී අහෝසි වන අතර, එකී හින් ජු ලී විසින් අප සමාගමේ නාමය යටතේ හෝ අප සමාගම වෙනුවෙන් සිදු කරන කිසිදු ක්‍රියාවන් සඳහා අප සමාගම වග නොකියන බව මහජනතාව වෙත මෙමගින් දන්වා සිටිමු.

ස්මාර්ට් ෂර්ට්ස් ලිමිටඩ්.

2016 මාර්තු මස 16 වැනි දින.

06-274

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : සෝල් ටෙරාකෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107561
ලියාපදිංචි කාර්යාලය : අංක 172, හල්ෆ්ට්ස්ඩ්‍රෝප් වීදිය,
කොළඹ 12,
ලියාපදිංචි කළ දිනය : 2015.08.06

සමාගමේ ලේකම්වරු.

06-292

## ඇමෙරිකන් පේපර් කන්වර්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2016 මැයි 10 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 113537 යටතේ ඇමෙරිකන් පේපර් කන්වර්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය දෙහිවල, චාර්ල්ස් පෙදෙස, අංක 12 4/1 හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති,
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු)

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

06-294

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ පෙර නම : ස්ටෙරෙඩියන් කැපිටල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අලුත් නම : ස්ටෙරෙඩියන් කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම වෙනස් වූ දිනය : 2016.04.08
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී 91493
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, නැගෙනහිර කුළුණ, 16 වන තලය හි අංක 16-03 හි යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක,
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගම් ලේකම්වරු)

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

06-295

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2009 සැප්තැම්බර් මස 30 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : කළම්බු ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පීවී 69379
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 11/1, නෙලුම් මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලූෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

06-328

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම පහත පළ කරමු.

සමාගමේ නාමය : ට්‍රොපිකල් ඩ්‍රීම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 113361
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.
සංස්ථාගත කළ දිනය : 2016.05.02

කෝපරේට් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-352

---

**දැනුම්දීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : චන්දෙකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 113665
ලියාපදිංචි ලිපිනය : අංක 3, චන්දෝ වීදිය, ගාල්ල
සංස්ථාගත දිනය : 2016 මැයි මස 16

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්,
සමාගම් ලේකම්වරු.

06-353

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

211/6, කේ. රූබන් පෙරේරා මාවත, දේවාලමුල්ල, බොරලැස්ගමුව යන ලිපිනයෙහි පදිංචි ජයසේකර විතානගේ සුසන්ත (ජා. හැ. අ. 813151596 වී) වන මා විසින්, ශ්‍රීමාලි පුංචිහේවා ප්‍රසිද්ධ නොතාරිස් 2014.01.24 වැනි දින ලියා සහතික කළ ඔප්පු අංක 595 යටතේ ලියාපදිංචි කළ ඔප්පුවෙහි ඇටෝර්නි අධිපති වන මා විසින්, 211/6, කේ. රූබන් පෙරේරා මාවත, දේවාලමුල්ල, බොරලැස්ගමුව යන ලිපිනයෙහි පදිංචි ස්වර්ණමාලි ද සේරම් (ජා. හැ. අ. 608154515 වී) වෙත පවරා තිබූ ඇටෝර්නි බලය අවලංගු කළ බව මෙයින් දන්වා සිටිමි.

06-326

---

**සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳව මහජනයා වෙත කෙරෙන නිවේදනයයි**

මෙහි පහත සඳහන් සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව 2016 මැයි මස 18 වැනි දින සංස්ථාගත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ද කළම්බු අයිස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 113758
සංස්ථාගත කිරීමේ දිනය : 2016 මැයි මස 18
ලියාපදිංචි කාර්යාලය : අංක 117, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2016 මැයි මස 27 වැනි දින.
06-329

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව දිසා අධිකරණයේ දී ය

නඩු අංකය : 3468 MB
ස්වභාවය : උකස්කරය
වටිනාකම : රු. 1,800,000
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී

...................පැමිණිලිකරු

එදිරිව

කොච්චිකඩේ, ෆාතිමා හරස් පාරේ, අංක 23 හි ජයසූරිය ආරච්චිගේ දෙන් ජෝශප් සිසිර අප්පුහාමි

.....................විත්තිකරු.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2012ක් වූ නොවැම්බර් මස 08 වැනි දින ඇතුලත් කරන ලද ඒකපාර්ශ්විකව නඩු තීන්දු ප්‍රකාරව පැමිණිලිකරුගේ වාසියට සහ විත්තිකරුට විරුද්ධව පහත සඳහන් පරිදි නියෝග කොට තීන්දු ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට-

(අ) ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රු. 1,740,000 ක මුදලක් සහ ඒ මත 2011 මැයි මස 20 වැනි දින දක්වා පොලිය වශයෙන් රු. 1,222,622ක් සහ එකී ගෙවීමට තිබෙන මුල් මුදල රු. 1,740,000ක මුදල මත 2011 මැයි මස 21 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 22% බැගින් පොළිය ද ගෙවන ලෙස නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

(ආ) තීන්දු ප්‍රකාශයේ සහ මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති එම සම්පූර්ණ බිම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි එයට අයත් හෝ අදාල සියලුම අයිතිවාසිකම් ද මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති පාරට වෙන්වූ කොටස පාවිච්චි කිරීමේ අයිතිය ද එම බිම් කොටසෙහි බිම් කොටසින් සහ බිම් කොටස මත විත්තිකරු හා උකස්කරු ද වන ජයසූරිය ආරච්චිගේ දෙන් ජෝසප් සිසිර අප්පුහාමි සතු සියලු බුදල් අයිතිවාසිකම් හිමිකම් දේපළ හිමිකම් පෑම සහ ඉල්ලුම් එකී නඩු නිමිත්ත මත ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් ෆිලීෂියන් ප්‍රනාන්දුපුල්ලේ විසින් සකස් කරන ලද 11216 සහ 2008.04.21 උකස්කරය යටතේ සහ පරිදි ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා බන්ධන වී ඇති බවට සහ ඇස්කිසි කළ හැකි බවට ද එකී නඩු නිමිත්ත මත එකී මුදල් අයකර ගැනීම සඳහා එකී උකස්කරය බලාත්මක කිරීමට පැමිණිලිකරුට හිමිකම් ඇති බවට ද නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත.

වර්ෂ 2012ක් වූ නොවැම්බර් මස 08 වැනි දින මීගමුව දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී වර්ෂ 2016ක් වූ ජූලි මස 08 වැනි දින පෙ. ව. 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ඇලෙන් එගොඩ පමුණුගම පිහිටි වැටකෙයා ගහවත්ත නමැති ඉඩම එකී ඉඩමට මායිම් උතුරට : ජුවාන් බෝපේ ආරච්චිගේ ඉඩම නැගෙනහිරට : කේ. ඩී. ජේ. ඇන්තනීගේ ඉඩම දකුණට : ජී. එල්. නිව්ටන් පෙරේරාගේ ඉඩම බස්නාහිරට : ඊ. ජයමාන්නගේ ඉඩම එහි පිහිටි ගොඩනැගිලි වැවිලි සියල්ල සහිතවයි. පර්චස් විසිහතක් (අ. 0, රූ. 0, පර්. 27) වේ. මෙය බී. 538/180 හි ලියාපදිංචි කර ඇත.

මෙය මෑතකදී සාදන ලද මිනින්දෝරු සැලැස්මට අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත අළුත් කුරු කෝරළේ, රාගම් පත්තුවේ ඇලෙන් එගොඩ පමුණුගම පිහිටි වැටකේයා ගහවත්තේ අංක 1 බිම් කැබැල්ල ලෙස ලකුණුකර ඇති සම්පූර්ණ බිම් කොටස බලයලත් මිනින්දෝරු තැන්පත් එස්. ආර්. පී. එල්. සේනානායක විසින් සාදන ලද අංක 1132/98 කේ. පී. සහ අංක 1998/07/26 දින දරන සැලැස්ම අනුව එකී ඉඩමට මායිම්, උතුරට : ජුවාන් බෝපේ ආරච්චිට සහ දැන් එම්. විජයසිංහගේ බෝගහවත්ත නැගෙනහිරට : ගෙවල් කරා වැටුණ පාර සහ ජෝසප් ඇන්තනීගේ ඉඩම දකුණට : ජී. එල්. නිව්ටන් පෙරේරාගේ වැටකේයා පොත වත්ත බස්නාහිරට : එස්. ජයමාන්නගේ වැටකේයා ගහවත්ත එහි පිහිටි ගොඩනැගිලි වැවිලි සියල්ල සහිතවයි. එකී සැලැස්මේ පාර මත මාර්ග අයිතිය සහිතවයි. එහි ප්‍රමණය : පර්චස් දහඅටක් (අ. 0 රූ. 0 පර්. 18) වේ.

*ඉඩමට පිවිසීම.*- මීගමුව-පමුණුගම බස් මාර්ගයේ ගමන් කර ඇලෙන් එගොඩ පමුණුගම හමුවේ. එතැනින් දකුණට ඇති රණවිරු බී. ඩී. ප්‍රියන්ත සපරමාදු මාවතේ මීටර් 400ක් පමණ ගමන් කළ විට එම පාරේ දකුණු පසින් අදළ දේපළ වන වරිපනම් අංක 174 හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ. (01) ගැනුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%), (02) නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස්කිරීමේ ගාස්තු රු. 7,500, (3) සියලුම ප්‍රචාරක වියදම්, (04) වෙන්දේසිකරුගේ

වෘත්තීමය ගාස්තු, (5) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු, (06) ලිපිකරු බෙරකරු හා සෝෂක ගාස්තු රු. 4,500, (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30ක් ඇතුළත දී මීගමුව දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය. ඔප්පු පරීක්ෂා කිරීමට සහ වෙනත් විස්තර සඳහා පහත අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු බලයලත් ජ්‍යෙෂ්ඨ
වෙන්දේසිකරු තක්සේරුකරු හා
උසාවි කොමසාරිස් වානිජ මහාධිකරණය
සහ කොළඹ දිසා අධිකරණයේ
සහ ගාල්ල දිසා අධිකරණයේ බලයලත්
වෙන්දේසිකරු.

රාජ්‍ය හා වාණිජ බැංකු අංක 200,
2 වන මහල හල්ෆ්ඩෝප් වීදිය, කොළඹ 12.
දුරකථන අංක 011 2445393/011 2396520
ෆැක්ස් අංකය : 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වන මහල,
මරදන පාර, කොළඹ 10
දුරකථන අංක 011- 2672262/011-2672263
ෆැක්ස් අංකය : 011 - 2683073

06-283

---

**ඉන්දියන් බැන්ක් - පීඑල්සී - යාපනය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඉතා වටිනා සියලු පහසුකම් සහිත ව්‍යාපාරික ස්ථානයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය නගර සහා සීමාව තුළ J/82 ග්‍රාම නිලධාරී වසම අග්නිදිග වන්නර්පොන්නායි ගමේ පිහිටි "පනන්කාඩු" නොහොත් පරෙයන්කාඩු නමැති ඉඩම බලයලත් මානක එස්. සුබ්‍රමානියම් විසින් 2010.01.12 වැනි දින සාදන ලද අංක 1307 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 01 ඉඩම් කොටස හා එහි තුළ පිහිටි මහල් ගොඩනැගිල්ල ඇතුලු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : 01 LMSV.C. සහ 1.97Kls .

මෙම දේපළ, යාපනය ස්ටැන්ලි පාර, අංක 285/287 දරන ස්ථානයේ "රාම් කන්ස්ට්‍රක්ෂන්" ව්‍යාපාරයේ අයිතිකරු වන කන්දසාමි පත්කුනරාජා සහ ඔහුගේ බිරිඳ වන අම්බිගාදේවි පත්කුනරාජා උකස්කරුවන් වශයෙන් ඉන්දියන් බැන්ක් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.-* යාපනය මධ්‍යම බස් නැවතුම් ස්ථානයේ සිට ස්ටැන්ලි පාර ඔස්සේ ගමන් ගත් විට මෙම පාරේ පිහිටි වරිපනම් අංක 285 සහ 287 දරන ගොඩනැගිල්ල අදළ දේපළ වේ.

2016 ක් වූ ජුනි මස 27 වැනි දින පෙ.ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.04.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2016.05.07 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමණාකාරිනී, ඉන්දියන් බැන්ක්, අංක 100, ස්ටැන්ලි පාර, යාපනය.

දුරකථන අංක : 075 - 5700215/ 021- 2220674/ 021 - 4920999.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන /ෆැක්ස් අංක : 081-2210595
ජංගම : 071 - 4962449/ 071 - 8446374.

06-312

## ඉන්දියන් බැන්ක් - යාපනය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඉතා වටිනා ව්‍යාපාරික ස්ථානයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ J/78 ග්‍රාම නිලධාරි වසමේ අග්නිදිග වන්නර්පොන්නායි ගමේ පිහිටි ''අලඩිතරායි'' නොහොත් කිඩයි විලුන්තාන් පල්ලම් නැමති ඉඩමට බලයලත් මානක එස්. සිවලෝගනාදන් විසින් 1989.06.21 වැනි දින සාදන ලද අංක 5474 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 01 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ව්‍යාපාරික ගොඩනැගිලි ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : 08.50 Kls.

මෙම දේපළ, යාපනය ස්ටැන්ලි පාර, අංක 71 ඒ දරන ස්ථානයේ ''කරන් ට්‍රේඩර්ස්'' යන ව්‍යාපාරයේ අයිතිකරු වන සෙල්ලතුරෙයි සිවකරන් යන අය උකස්කරුවන් වශයෙන් ඉන්දියන් බැන්ක් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- යාපනය මධ්‍යම බස් නැවතුම් ස්ථානයේ සිට රෝහල් පාරේ නැගෙනහිර දෙසට රෝහල් පාර පේදුරුතුඩුව පාර හන්දිය දක්වා ගමන් ගෙන පේදුරුතුඩුව පාරට ඇතුළු වී එම පාරේ මීටර් 350ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසන් අදාළ දේපළ පිහිටා තිබේ.

2016 ක් වූ ජුනි මස 27 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.04.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2016.05.09 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමණාකාරිණී ඉන්දියන් බැන්ක්, අංක 100, ස්ටැන්ලි පාර, යාපනය.

දුරකථන අංක : 075 - 5700215/ 021- 2220674/ 021 - 4920999.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක/ෆැක්ස් : 081-2210595
ජංගම : 071 - 4962449/ 071 - 8446374.

06-313

---

## ඉන්දියන් බැන්ක් - යාපනය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඉතා වටිනා සියලු පහසුකම් සහිත ව්‍යාපාරික ස්ථානයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය නගර සභා සීමාවන් තුළ J/82 ග්‍රාම නිලධාරී වසමේ අග්නිදිග වන්නර්පොන්නායි ගමේ පිහිටි ''අනිත්විලාඩි'' නැමති ඉඩම් කොටස හා හි පිහිටි යාපනය කේ. කේ. එස්. පාරේ වරිපනම් අංක 198 දරන ව්‍යාපාරික මහල් ගොඩනැගිල්ල ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : (01 LMS Vc.) 01 ලාවම් වී. සී.

මෙම දේපළ, යාපනය කේ. කේ. එස්. පාර, අංක 198 දරන ස්ථානයේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන මල්ටි ජැෆ්නා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදයි වශයෙන් හා සෙල්ලයියා ගජේන්ද්‍රන් සහ ගජේන්ද්‍රන් වාසුකී උකස්කරුවන් වශයෙන් ඉන්දියන් බැන්ක් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- යාපනය ප්‍රධාන තැපැල් කාර්යාල පරිශ්‍රයේ සිට කන්කසන්තුරේ පාරේ උතුරු දිසාවට මීටර් 75ක් පමණ ගමන් ගත් විට අදළ දේපළ පිහිටා තිබේ.

2016 ක් වූ ජුනි මස 27 වැනි දින ප.ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.04.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2016.05.09 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමණාකාරිණී ඉන්දියන් බැන්ක්, අංක 100, ස්ටැන්ලි පාර, යාපනය.

දුරකථන අංක : 075 - 5700215/ 021- 2220674/ 021 - 4920999.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන /ෆැක්ස් : 081-2210595
ජංගම : 071 - 4962449/ 071 - 8446374.

06-314

**ඉන්දියන් බැන්ක් - යාපනය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඉතා වටිනා සියලු පහසුකම් සහිත ව්‍යාපාරික ස්ථානයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය නගර සභා සීමාවන් තුළ J/82 ග්‍රාම නිලධාරී වසමේ අග්නිදිග වන්නර්පොන්නායි ගමේ පිහිටි ''අනිත්විලාඩි'' නැමති ඉඩම් කොටස හා හි පිහිටි යාපනය කේ. කේ. එස්. පාරේ වරිපනම් අංක 198 දරන ව්‍යාපාරික මහල් ගොඩනැගිල්ල ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය :(01 LMS Vc.) 01 ලාවම් වී. සී.

මෙම දේපළ, යාපනය කේ. කේ. එස්. පාර, අංක 198 දරන ස්ථානයේ ''පෙරවිනා හාඩ්වෙයාර්'' ව්‍යාපාරයේ අයිතිකරු වන සෙල්ලයියා ගජේන්ද්‍රන් හා ඔහුගේ බිරිඳ වන ගජේන්ද්‍රන් වාසුකී උකස්කරුවන් වශයෙන් ඉන්දියන් බැන්ක් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- යාපනය ප්‍රධාන තැපැල් කාර්යාල පරිශ්‍රයේ සිට කන්කසන්තුරේ පාරේ උතුරු දිසාවට මීටර් 375ක් පමණ ගමන් ගත් විට අදළ දේපළ පිහිටා තිබේ.

2016 ක් වූ ජුනි මස 28 වැනි දින ප.ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.04.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2016.05.09 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමණාකාරිනී ඉන්දියන් බැන්ක්, අංක 100, ස්ටැන්ලි පාර, යාපනය.

දුරකථන අංක : 075 - 5700215/ 021- 2220674/ 021 - 4920999.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක/ෆැක්ස් : 081-2210595
ජංගම : 071 - 4962449/ 071 - 8446374.

06-315

---

## ඉන්දියන් බැන්ක් - පීඑල්සී - යාපනය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඉතා වටිනා සියලු පහසුකම් සහිත ව්‍යාපාරික ස්ථානයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය නගර සභා සීමාව තුළ J/82 ග්‍රාම නිලධාරී වසම අග්නිදිග වන්නර්පොන්නායි ගමේ පිහිටි ''පනන්කාඩු'' නොහොත් පරෙයන්කාඩු නැමති ඉඩම බලයලත් මානක එස්. සුබ්‍රමානියම් විසින් 2010.01.12 වැනි දින සාදන ලද අංක 1307 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 01 ඉඩම් කොටස හා එහි තුළ පිහිටි මහල් ගොඩනැගිල්ල ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : 01 LMS V. C. සහ 1.97 Kls

මෙම දේපළ, යාපනය රෝහල් පාර, අංක 584 දරන ස්ථානයේ පිහිටි ''හොටෙල් ලව්සි'' ව්‍යාපාරයේ අයිතිකරු වන කන්දසාමි පත්කුනරාජා සහ ඔහුගේ බිරිඳ වන අම්බිගාදේවි පන්කුනරාජා උකස්කරුවන් වශයෙන් ඉන්දියන් බැන්ක් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම*.- යාපනය මධ්‍යම බස් නැවතුම් ස්ථානයේ සිට ස්ටැන්ලි පාර ඔස්සේ ගමන් ගත් විට මෙම පාරේ පිහිටි වරිපනම් අංක 285 සහ 287 දරන ගොඩනැගිල්ල අදළ දේපළ වේ.

2016 ක් වූ ජුනි මස 28 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.04.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2016.05.07 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමණාකාරිනී ඉන්දියන් බැන්ක්, අංක 100, ස්ටැන්ලි පාර, යාපනය.

දුරකථන අංක : 075 - 5700215/ 021- 2220674/ 021 - 4920999.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක/ෆැක්ස් : 081-2210595
ජංගම : 071 - 4962449/ 071 - 8446374.

06-316

**ඉන්දියන් බැන්ක් - යාපනය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඉතා වටිනා සියලු පහසුකම් සහිත ව්‍යාපාරික ස්ථානයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය නගර සභා සීමාවන් තුළ J/82 ග්‍රාම නිලධාරී වසම අග්නිදිග වන්නර්පොන්නායි ගමේ පිහිටි ''උවයාඩි'' නමැති ඉඩමට බලයලත් මානක කේ. පරමේෂ්වරන් විසින් 2011.05.26 වැනි දින සාදන ලද අංක 412/2011 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 01 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : 01 LMS VC. සහ 06.30 Kls.

මෙම දේපළ, යාපනය පොන්නම්පලම් පාර, අංක 42 සී දරන ස්ථානයේ පිහිටි ''තයාන් හාඩ්වෙයාර්'' යන ව්‍යාපාරයේ අයිතිකරු හා යාපනය 4 වන හරස් වීදියේ අංක 134 දරන ස්ථානයේ පදිංචි පත්කුනරාජා තයන්රාජ් උකස්කරු වශයෙන් ඉන්දියන් බැන්ක් වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම*.- යාපනය මධ්‍යම බස් නැවතුම් ස්ථානයේ සිට පොන්නම්පලම් පාරේ කි. මී. 0.50ක් පමණ ගමන් ගත්විට Merchant Credit of Sri Lanka යාපනය ආයතනය ඉදිරිපිටින් අදළ දේපළ පිහිටා ඇත.

2016 ක් වූ ජුනි මස 28 වැනි දින පෙ.ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.04.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* 2016.05.07 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමණාකාරිනී ඉන්දියන් බැන්ක්, අංක 100, ස්ටැන්ලි පාර, යාපනය.

දුරකථන අංක : 075 - 5700215/ 021- 2220674/ 021 - 4920999.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක/ෆැක්ස් : 081-2210595
ජංගම : 071 - 4962449/ 071 - 8446374.

06-317